## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුර

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ** පහත තනතුරු සඳහා පත් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
|---|---|
| 1 | ගම්පහ |
| 2 | මාතලේ |
| 3 | නුවරඑළිය |
| 4 | අම්පාර |
| 5 | පුත්තලම |
| 6 | පොළොන්නරුව |
| 7 | බදුල්ල |
| 8 | මොනරාගල |
| 9 | මන්නාරම |

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් නොමැති අවස්ථාවල දී එම ශ්‍රේණියේ වසර 03ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් තනතුරෙහි පූර්ණ කාලීනව රාජකාරි ඉටුකිරීමට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති සංග්‍රහයේ 141 හි විධිවිධානයන්ට යටත්ව, පසුව තවදුරටත් සේවය දීර්ඝ කිරීමේ හැකියාව සහිතව, උපරිමය වසරක කාල සීමාවක් සඳහා රාජකාරි ඉටුකිරීමේ පත්කිරීම් සිදු කරනු ලැබේ.

අයදුම්කරුවන් විසින් **මෙයට යාකොට ඇති ආකෘතිය** අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද තම පෞද්ගලික තොරතුරු පත්‍රිකාවක් **ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිල මැදුර, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** යන ලිපිනය වෙත **ලැබෙන පරිදි 2023.03.30 දිනට පෙර** තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතු අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් 2023.03.28 දිනට ප්‍රථම distaddivisionnew@gmail.com ඉ-තැපැල වෙත ද යොමු කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හා නියමිත අයදුම්පත් ආකෘතිය මඟින් ඉදිරිපත් කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 2.0 අයදුම්කරන්නාගේ තොරතුරු

### 2.1 පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්

i. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබීම වඩාත් යෝග්‍ය වේ.

ii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ටය (ඉ) හි නිශ්චිතව දක්වා ඇති ඕනෑම ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා තිබීම.

iii. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය.

## 2.2 ශක්තීන්

(ඵලදායී ලෙස සිදු කළ යුතු මෙන්ම එසේ සිදු කිරීමට අයදුම්කරුවන්ගේ <u>අභිප්‍රේරණයක්</u> සිදු කරනු ලැබිය යුතුය.)

i. අන්තර් පුද්ගල සම්බන්ධතා
ii. උපාය මාර්ගික බව
iii. කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරන්නෙකු වීම

## 2.3 චර්යාත්මක නිපුණතා

(ඵලදායී ලෙස සිදු කළ යුතු ක්‍රියා හා ක්‍රියාකාරකම්)

i. නායකත්වය
ii. සන්නිවේදනය හා යහපත් බලපෑම් ඇති කිරීම
iii. සාමූහිකව කටයුතු කරන්නෙකු වීම

## 3.0 තෝරාගැනීමේ ක්‍රමවේදය

ජීවදත්ත තොරතුරු හා සම්මුඛ පරීක්ෂණයේ දී තක්සේරු කරනු ලබන ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත තෝරා ගැනීම සිදු කෙරේ/පදනම් වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සඳහා වන නිර්ණායකයන් සඳහා කරුණාකර 2022.09.15 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 6(b) වගන්තිය වෙත යොමු වන්න.

## 3.1 ලකුණු දීමේ පටිපාටිය

| ශීර්ෂය | උපරිම ලකුණු | ඇගයීම් ක්‍රමවේදය |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨත්වය**<br>ජ්‍යෙෂ්ඨතම අයදුම්කරු වෙත උපරිම ලකුණු ප්‍රදානය කරනු ලබන අතර, ඊට සමානුපාතිකව අනෙකුත් අයදුම්කරුවන් හට ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | 50 | ජීවදත්ත තොරතුරු පත්‍රිකාව |
| **සමාජ සංවර්ධනය, ප්‍රාදේශීය/ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පළපුරුද්ද**<br>ක්ෂේත්‍රයේ සේවා කාලය/ විෂයානුබද්ධතාවය හැරුණු විට ඉහත ක්ෂේත්‍රයන්හි නිරත වීම තුළින් ලබා ගන්නා දැනුම් ගැඹුර හෝ ප්‍රවීණත්වය මෙහිදී තක්සේරු කරනු ලැබේ. | 20** | |

| | | |
|---|---|---|
| වෘත්තිය සුදුසුකම්<br>**(1)** ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨය (ඉ)හි නිශ්චිතව දක්වා ඇති ඕනෑම ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි/වෘත්තිය සුදුසුකම්<br>(අ) පර්යේෂණ මත පදනම් වූ පශ්චාත් උපාධිය - ලකුණු 07<br>(ආ) පාඨමාලාවේ ඉගැන්වීම මත පශ්චාත් උපාධිය - ලකුණු 06<br>(ඇ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 05<br>(ඈ) උපාධි/පශ්චාත් උපාධි සහතික/උසස් ජාතික ඩිප්ලෝමා - ලකුණු 04<br>(ඉ) ඩිප්ලෝමා - ලකුණු 03<br>**(2)** සංවර්ධන සැලසුම්කරණ පුහුණුව*<br>(අ) මාස 03ක් හෝ ඊට වැඩි - ලකුණු 01<br>(ආ) දින 10ක් හෝ ඊට වැඩි - ලකුණු 0.5<br>(ඇ) දින 03ක් හෝ ඊට වැඩි - ලකුණු 0.2<br>**(3)** ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය<br>(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයක් වෙතින් ලබාගත් ඩිප්ලෝමාවක්/ IELTS සමස්ථ ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL – IBT 79 හෝ ඊට ඉහළ, TOEFL – CBT 213 හෝ ඊට ඉහළ, TOEFL – PBT 550 හෝ ඊට ඉහළ- ලකුණු 02<br>(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් සහතික පත්‍රයක් - ලකුණු 01<br>* ඉහළම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 10 | |
| ශක්තීන්<br>ඉහත 2.2 හි දක්වා ඇති පරිදි අයදුම්කරුවන් අභිප්‍රේරණය වන පරිදි කාර්යයන් ඵලදායී අයුරින් ඉටු කළ යුතු ය. | 10** | සම්මුඛ පරීක්ෂණය |
| චර්යාත්මක නිපුණතාවන්<br>ඉහත 2.3 හි දක්වා ඇති පරිදි කාර්යයන් හා ක්‍රියාකාරකම් ඵලදායී අයුරින් ඉටු කරනු ලැබිය යුතු ය. | 10** | |
| ** ප්‍රශ්න ආකෘති හා ශ්‍රේණිගත කිරීමේ පරිමාණයන් සඳහා කරුණාකර 2022.09.15 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 හි ඇමුණුම II වෙත යොමු වන්න. | | |

සටහන 1 - ඉහත ලකුණු ලබාදීමේ පටිපාටියේ "පිළිගත් විශ්වවිද්‍යාලය" යන්න විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් යන්න අදහස් කෙරේ.

සටහන 2 - ඉහත ලකුණු ලබාදීමේ පටිපාටියේ සියලුම පශ්චාත්/වෘත්තීය සුදුසුකම්,

(I.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ (වෙනත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයක් වෙතින් ලබා ගත් එවැනි සුදුසුකම් සඳහා එම කොමිෂමේ පිළිගැනීම තිබිය යුතු ය.)

(II.) රජයේ පුහුණු ආයතනයකින් හෝ පිළිගත් විදෙස් ආයතනයකින් ලබා තිබිය යුතුය.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දිනය : 2023 මාර්තු මස 15. වන දින